# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,258 - 2021 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා - 2021.12.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 2686 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 2696 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 2705 |


*සැ. යු.* - වෛද්‍ය එස්. එස්. ගුණවර්ධන දේශීය ආයුර්වේද සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 දෙසැම්බර් 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 දෙසැම්බර් මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 දෙසැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ තනතුරු පුරප්පාඩු
## (බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවය)

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.)

01. සෞඛ්‍ය පරිපාලක (III ශ්‍රේණිය) - පුරප්පාඩු 05
02. වැඩ/ක්ෂේත්‍ර පරිපාලක (III ශ්‍රේණිය) - පුරප්පාඩු 06

(*බඳවා ගැනීමේ පරිපාටිය* - 2014.02.25 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ පරිපාලක තනතුරු සඳහාවන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.)

*වැටුප් පරිමාණය* :- MN-1-2016 (රා.ප.ච. 03/2016 අනුව)
රු. 27,140 - 10x300 - 11x350 -10x495 - 10x660 - රු. 45,540/-
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

<u>බඳවා ගැනීමේ සුදුසුකම්</u>

*(අ)* i. ***අධ්‍යාපන සුදුසුකම් : (විවෘත අයදුම්කරුවන් සඳහා)***

- භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

ii. ***අධ්‍යාපන සුදුසුකම් : (සීමිත අයදුම්කරුවන් සඳහා)***

- අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට හා ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුයි.)

*(ආ)* ***පළපුරුද්ද : (සීමිත අයදුම්කරුවන් සඳහා පමණි)***

- පළාත් පාලන ආයතනයක **PL**-1 හා **PL**-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05)ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය.

*(ඇ)* ***වයස :***

- (විවෘත අයදුම්කරුවන් සඳහා)
  අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

- (සීමිත අයදුම්කරුවන් සඳහා)
  දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට මෙම වයස් සීමාවන් අදාළ නොවේ.

*(ඈ)* මෙම දැන්වීමෙහි පහතින් "**බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි**" යටතේ දක්වා ඇති i සිට iii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

*(ඉ)* ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

- ලිඛිත පරීක්ෂණයේ සංයුතිය (විවෘත අයදුම්කරුවන් සඳහා)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 100 | 40% |

***සටහන*** **:** ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙල අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

- ලිඛිත පරීක්ෂණයේ සංයුතිය (සීමිත අයදුම්කරුවන් සඳහා)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණය | 100 | 40% |

***සටහන*** **:** ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයකට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පරීක්ෂණ දෙකෙන්ම ඉහළ ලකුණු ලබා ගන්නා අය පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

- සීමිත හා විවෘත ලිඛිත පරීක්ෂණය සඳහාවන විෂය නිර්දේශය ඇමුණුම 01 මගින් දක්වා ඇත.

*(ඊ)* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (සීමිත අයදුම්කරුවන් සඳහා පමණි.)

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය | 15 | 25 |
| වැඩ බැලීම හෝ රාජකාරී ඉටු කිරීම | 10 | |
| ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම | 20 | |
| පෞරුෂත්වය | 05 | |

***සටහන*** **:** සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සලකා බලනු ලැබේ.

*සැ.යු.* : සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකිවන අවස්ථාවල දී පමණක් විවෘත අයදුම්කරුවන් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

01. ***බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :***

i. අයදුම්කරු **ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු** විය යුතුය.
ii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න **වසර 03 ක කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය** ඇති තැනැත්තෙකු විය යුතුය. (දෙහිවල ගල්කිස්ස බල ප්‍රදේශයේ අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)

iii. **යහපත් චරිතයකින්** හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් **ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින්** යුක්ත විය යුතුය.

iv. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළ පරීක්ෂණවල දී කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන් ද යන්න දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතුය.

v. කිසියම් අයදුම්කරුවෙකු බඳවා ගැනීමේ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ එම පරීක්ෂණයට භාජනය කළ පමණින් ඒ අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස නොසලකනු ලැබේ.

02. ***සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :***

i. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය.

ii. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

iii. බඳවා ගනු ලබන තැනැත්තන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. (දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු පත්වීම ස්ථිර කරන ලද සේවකයින් වසර 01 ක වැඩ බැලීමේ කාලයකට යටත් කරනු ලැබේ.)

iv. මෙයට අමතරව ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති, බස්නාහිර පළාත් මූල්‍ය රීති, බස්නාහිර පළාත් විනය කාර්ය පටිපාටික රීති සංග්‍රහය, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හා බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත් විය යුතුය.

03. ***අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :***

i. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘති අනුව, අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.
ii. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබූ විට පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර "ආ" සිට "උ" දක්වාවන සහතිකවල ඡායා පිටපත් අයදුම්පත සමග එවිය යුතුය.

*(අ).* උප්පැන්න සහතිකය ;
*(ආ).* අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම දක්වෙන වෙනත් සහතික ;
*(ඇ).* වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික;
*(ඈ).* පළපුරුද්ද පිළිබඳ සහතික ;
*(ඉ).* තනතුරට අදාළ වෙනත් සහතික ;
*(ඊ).* ජාතික හැඳුනුම්පතේ / රියැදුරු බලපත්‍රයේ දෙපැත්තේ ඡායාස්ථිත පිටපත ;
*(උ).* ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය (මෙම සහතිකය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස 6 කට නොඅඩු කාලයක් තුළ ලබාගත් එකක් විය යුතු අතර වසර 3 ක ස්ථිර පදිංචිය සනාථ කිරීමේ දී අවිනිශ්චිතව ලබා දී ඇති සනාථ කිරීම් සළකා බලනු නොලැබේ. "*උදා :- වසර 05ක සිට පදිංචිව සිටින බව පවසයි* ")
*(ඌ).* චරිත සහතිකයක්.

iii. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන්කර **2021.12.31** වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව, දෙහිවල"** යන ලිපිනයට ලියාපදිංචිතැපෑලෙන් එවිය යුතුය.

iv. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුක්තවූවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

v. තැපෑලේ දී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vi. අදාළ බඳවා ගැනීමේ පරිපාටිවලට අනුව මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් තෝරා ඔවුන් බඳවා ගැනීමේ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පතෙහි සාවද්‍ය තොරතුරු සඳහන් කර පරීක්ෂණ සඳහා සහභාගී වූ බවට අනාවරණය වුවහොත් එවැන්නන් අසාධු ලේඛනගත කිරීමට කටයුතු කරනු ලබන අතර එසේ වුවහොත් මින් ඉදිරියට මෙම සභාව සඳහා සිදු කරන කිසිදු සේවක බඳවා ගැනීමක් සඳහා අයදුම් කිරීමේ අවස්ථාව එවැනි අයදුම්කරුවන්ට අහිමි වනු ඇත.

අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ තනතුරු ප්‍රමාණය වෙනස් කිරීමේ හෝ බඳවා ගන්නා ප්‍රමාණය තීරණය කිරීමේ බලය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලු කාරණා පිළිබඳ අවසාන තීරණය දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස්,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

2021 දෙසැම්බර් මස 10 වැනි දින.

**ඇමුණුම 01**

පරිපාලක III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම (සීමිත) සඳහාවන ලිඛිත පරීක්ෂණය
විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්නපත්‍රය ආර්ථික, සාමාජීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් හා අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | ***සෞඛ්‍ය පරිපාලක :***<br>● මහජන සෞඛ්‍ය සුහසාධනය පිළිබඳ ඒ ඒ පළාත් පාලන ආයතන මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කිරීමේ දී කසල අපහරණය කිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කිරීම, කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම පිළිබඳ මූලික දැනුම මැන බැලීම.<br>● සුළු සේවක කටයුතු අධීක්ෂණය හා පරිපාලනය, පැමිණීම සටහන් කිරීම, නිවාඩු ලබා ගැනීමේ දී අනුගමනය කරන ක්‍රමවේදයන්.<br>● මැසි මදුරු උවදුර වළක්වා ගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම. |
| | ***වැඩ/ක්ෂේත්‍ර පරිපාලක :***<br>පළාත් පාලන අණපනත් මගින් ඒ ඒ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී කර්මාන්ත අංශයෙන් සිදු කරන කටයුතු වල දී මාර්ග එළි කිරීම්, කාණු පද්ධති සකස් කිරීම්, පෙර මිශ්‍රණ එළීම හා මාර්ග නඩත්තු කටයුතුවල යොදවා ඇති සේවකයින්ගේ රාජකාරී කටයුතු අධීක්ෂණය හා පරිපාලනය, පැමිණීම සටහන් කිරීම, නිවාඩු ලබා ගැනීමේ දී අනුගමනය කරන ආකාරය පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම. |

**පරිපාලක III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම (විවෘත) සඳහාවන ලිඛිත පරීක්ෂණය**
**විෂය නිර්දේශය**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සාමාජීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් යුක්ත වේ. |
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය | තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව, භාෂා හැකියාව මැන බැලීම |

**ඇමුණුම 02**

***දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ***
***සෞඛ්‍ය පරිපාලක, වැඩ/ක්ෂේත්‍ර පරිපාලක තනතුර සඳහා අයදුම්පත***

**1. ජීව දත්ත තොරතුරු :**

1.1. අයදුම්කරුගේ සම්පූර්ණ නම : (මුලකුරු සමග) (*උදා*- සිල්වා ඒ. බී. සී.)
.............................................................................................................................

1.2. සම්පූර්ණ නම : .............................................................................................................................

1.3. ස්ථිර ලිපිනය : .............................................................................................................................

1.4. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

1.5. ස්ත්‍රී/ පුරුෂ භාවය : .............................................................................................................................

1.6. දුරකථන අංකය : .............................................................................................................................

1.7. උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

1.8. 2021.12.24 දිනට වයස : අවු : ................ මාස : ...................... දින : ............................

**2. අධ්‍යාපන සුදුසුකම් :**

2.1. අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| i | | vi | |
| ii | | vii | |
| iii | | viii | |
| iv | | ix | |
| v | | x | |

2.2. අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| i | | vi | |
| ii | | | |
| iii | | | |

**3. ඔබ දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් ද?** ........................................................

එසේ නම්,

3.1. ඔබ දැනට දරන තනතුර : ..........................................................................................................

3.2. ස්ථිර පත්වීම් දිනය : ..........................................................................................................

3.3. සේවය ස්ථිර කරන ලද දිනය : ..........................................................................................................

**4. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :**

4.1. ඔබ විසින් ඉල්ලුම් කරන ලද තනතුරට අදාළ වෘත්තීය පළපුරුද්දක් ලබා තිබේ ද : ..........................................

4.2 එසේ නම් පුහුණුව ලැබූ ආයතනයේ නම : ..........................................................................................

4.3 පුහුණුව ලැබූ කාලය : (මාස 03/ මාස 06/ අවුරුදු 01) : ..............................................................................

**5. තනතුරට අදාළ වෙනත් සුදුසුකම් :**

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

**6. ඉහත තොරතුරු සනාථ කිරීමට අදාළ පහත ලිපි ලේඛන ඉදිරිපත් කර ඇති බව සනාථ කිරීම**

(අදාළ කොටුව තුළ ✓ හෝ X ලකුණ යොදන්න)

| | ඉදිරිපත් කර ඇති බව |
|---|---|
| 6.1 උප්පැන්න සහතිකයේ සහතිකකළ පිටපතක් ; | |
| 6.2 ජාතික හැඳුනුම්පතෙහි සහතිකකළ පිටපතක් ; | |
| 6.3 අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම දැක්වෙන වෙනත් සහතිකවල සහතිකකළ ඡායා පිටපත් ; | |
| 6.4 පළපුරුද්ද පිළිබඳ සහතික ; | |
| 6.5 පළාත් පාලන ආයතනයක PL-1 හා PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබමින්, ස්ථිර සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති බවට ආයතන ප්‍රධානියා විසින් නිකුත් කල ලිපිය ; *(රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි)* | |
| 6.6 ස්ථිර පත්වීම් ලිපියේ පිටපතක් ; *(රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි)* | |
| 6.7 සේවය ස්ථිර කිරීමේ ලිපිය ; *(රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි)* | |
| 6.8 පදිංචිය සනාථ කිරීමේ සහතිකය ; | |
| 6.9 චරිත සහතිකය ; | |

**අයදුම්කරුගේ සහතිකය :**

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරාගැනීමෙන් පසු දැන ගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් දනිමි.

දිනය :.............................................                                   ........................................................

අයදුම්කරුගේ අත්සන

*සැ.යු.* නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්, අදාළ සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලි අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12-347